දිවි අහිමි කර ගැනීම් සම්බන්ධ පුවත් වාර්තා කිරීමේදී, උපකාරක අංක සඳහන් කිරීමට මාධ්‍ය ආචාර ධර්ම තුළින් දිරිමත් කෙරේ. උපකාරක අංක වල වැදගත්කම වන්නේ, ඇතැම් විට, දිවි තොර කරගැනීමට නැඹුරුතාවයක් ඇති පුද්ගලයින්ට උපදේශන සහාය පැතීමට පෙළඹවිය හැකි වීමයි.

දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් සමගින් උපකාරක අංක සඳහන් කිරීමේ අවශ්‍යතාවය සහ වැදගත්කම Ethics Eye විසින් නිරන්තරයෙන් අවධාරණය කර සිටින්නේ, ඉන් අද වන විට ගෝලීය සමාජ සෞඛ්‍ය ගැටලුවක් බවට පත්ව ඇති දිවි තොර කරගැනීම් අවම කරගැනීමට උපකාරී වන බැවිනි.

සිළුමිණ පුවත්පතේ (10/03) ලිපියක් ඔස්සේ, ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී හදිසි උපකාරක අංක සහ ඒ හරහා ලබාගත හැකි සේවාවන් සවිස්තරාත්මකව දක්වා තිබුණි. එය සැබැවින්ම ප්‍රශංසා කටයුතු, ආදර්ශමත් වාර්තාකරණයකි.

මේ අයුරින් දිවි තොර කරගැනීම් සම්බන්ධ වාර්තාකරණයන් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීමේ භාවිතයක් අනෙක් මාධ්‍යයන් තුළද වැඩි වශයෙන් දක්නට ලැබෙනු ඇතැයි අපි බලාපොරොත්තු වන්නෙමු.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

**#MediaEthicsSL #lka #sinhalanews #Silumina**